| ඉතිහාසය<br>රට හදන ඉතිහාසය පන්තිය | | | |
|---|---|---|---|
| අ පො ස සාමාන්‍ය පෙළ 2020 (2021 මාර්තු) | | | |
| ශ්‍රේණිය 11 | විෂය - ඉතිහාසය | පත්‍රය I | කාලය - පැය 3 |

- **සියලුම බහුවරණ වලට ඔබට දී ඇති පිළිතුරු පත්‍රයේ පිළිතුරු දක්වන්න.**

(01) පළමුවරට කාර්මික විප්ලවය ඇරඹියේ,

1. ඉන්දියාවේ 2. ඇමරිකාවේ
3. බ්‍රිතාන්‍යයේ 4. චීනයේ

(02) 1736 වර්ෂයේ දී නිව්කොමන්ගේ වාෂ්ප එන්ජිම වැඩි දියුණු කරමින් විධිමත් වාෂ්ප එන්ජිමක් නිපදවූයේ,

1. ජේම්ස් වොට් 2. රිචඩ් ආර්ක්රයිට්
3. ඒබ්‍රහම් ඩර්බි 4. විලියම් සීමන්ස්

(03) පෙනී තැපැල් සේවය ඇරඹි වර්ෂය වන්නේ,

1. 1943 2. 1848 3. 1868 4. 1840

(04) 1844 වර්ෂයේ දී සොයාගත් නව සොයාගැනීම තුළින් ස්ථාන දෙකක් අතර විදුලි කම්බියක් යොදාගෙන සංකේත උපයෝගී කරගනිමින් පණිවිඩ හුවමාරු කරගැනීමේ ක්‍රමය සොයාගන්නා ලද්දේ,

1. ජෝර්ජ් ස්ටීවන්සන් 2. සැමුවෙල් මෝස්
3. රොබට් පුල්ටන් 4. එඩ්මන්ඩ් කාර්ට්රයිට්

(05) කාර්මික විප්ලවය නිසා සමාජ ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කමක් නොවන්නේ,

1. නාගරීකරණය වීම 2. පන්ති සහිත සමාජයක් බිහිවීම
3. බද්ද ව්‍යාපාර සමාගම් බිහිවීම 4. නව රැකියා බිහිවීම

(06) මෙරට දුම්රිය මාර්ග ඉදිකිරීම සඳහා පියවර ගත්තේ,

1. හෙන්රි වෝඩ් 2. තෝමස් මෙට්ලන්ඩ්
3. ෆෙඩ්රික් නෝර්ත් 4. රොබට් බ්‍රවුරිග්

(07) 1762 වර්ෂයේ දී උඩරටට පැමිණි ජෝන් පයිබස්ට පසුව මෙහි උඩරට රාජ්‍යයට පැමිණි දූත පිරිස පැමිණි වර්ෂය සමඟින් නිවැරදි පිළිතුර වන්නේ,

1. 1795 රොබට් ඇන්ඩෲස් 2. 1862 රොබට් ඇන්ඩෲස්
3. 1862 හියු බොයිඩ් 4. 1782 හියු බොයිඩ්

(08) ලන්දේසීන් සම්බන්ධව පහත වගන්ති අතුරින් අසත්‍ය ප්‍රකාශ වන්නේ,

1. 1656 දී මෙරට මුහුදුබඩ ප්‍රදේශවල බලය තහවුරු කරගැනීම.
2. ඉංග්‍රීසීන් සමඟ සාමකාමී ගිවිසුමක් මගින් මෙරටින් ඉවත්ව ගියේ ය.
3. 1795 වර්ෂය වන විට මෙරට ලන්දේසී ආණ්ඩුකාරවරයා ලෙස කටයුතු කළේ ෆන් එංගල් බෙක්ය.
4. මුල් කාලයේ සිටම ලන්දේසීන් හා ඉංග්‍රීසීන් අතර ගැටුම් ඇතිවිය.

(09) මෙරට පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගෙන උඩරට රාජධානිය යටත් කරගැනීමට සුදුසු වාතාවරණය සකස් කරදීමට වෙහෙසුණේ,

1. ජෝන් පයිබස් 2. ජෝන් ඩොයිලි
3. හියු බොයිඩ් 4. රොබට් ඇන්ඩෲස්

(10) 1848 දී බදු ප්‍රතිපත්තියට විරෝධය දක්වමින් රජය හා මහජනයා අතර ගැටුම් ඇති වූ අතර සටනේ ප්‍රධාන මධ්‍යස්ථානය වූයේ,

1. මහනුවර 2. මාතලේ
3. වාරියපොළ 4. කුරුණෑගල

(11) ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් මානවයා මළ සිරුරු වකුටු වන ආකාරයට වල දමා ඇති බව සනාථ වන කරුණක් සොයාගෙන ඇත්තේ,

1. කිතුල්ගල බෙලිලෙනෙන් 2. කුරුවිට බටදොඹ ලෙනෙන්
3. බෙල්ලන් බැඳි පැලැස්සෙන් 4. පාහියන්ගල ගල්ගුහාවෙන්

(12) වරාය ආශ්‍රිතව පැවති ගම් හඳුන්වා ඇත්තේ,

1. මණිකාරගාම 2. පට්ඨානගාම
3. කේවට්ටගාම 4. නියම්ගම්

(13) කුඩා ගම්වැව් වලින් කළ හැකි වැඩ කොටස පුළුල් කිරීම සඳහා එම ගම්වැව් ඇළ මාර්ගවලට සම්බන්ධ කිරීම වියළි කලාපයේ ගැමියෝ විසින් එය හඳුන්වන ලද්දේ,

1. වැව් සමූහය 2. එක්තැන්සමිය
3. වැව් මාර්ගය 4. එල්ලංගාව

(14) එක් වැව් පද්ධතියකට අයත් ගම් සියල්ල නියෝජනය කිරීමට යෙදූ තැනැත්තා හඳුන්වන්නේ,

1. ගහපති 2. ගෘහපති
3. පරුමක 4. ගමික

(15) ලම්භකර්ණ රජපෙළපතේ ආරම්භක පාලකයා,

1. මහසෙන් රජු 2. දුටුගැමුණු රජු
3. පළමුවන විජයබාහු රජු 4. වසභ රජු

(16) රුහුණේ වසාය කළ රජයේ නිලධාරියෙක් වන සිත්නාරුබිම බුදල්නාගේ රැකවරණය ලබමින් හැදී වැඩුණු රජතුමා වන්නේ,

1. පළමුවන කාශ්‍යප රජු 2. පළමුවන විජයබාහු රජු
3. වසභ රජු 4. දුටුගැමුණු රජු

(17) පිළිස්සූ මැටි වළං භාවිතය,

- ස්ථිර ජනාවාස හා වාසස්ථාන ගොඩනැගීම.
- ක්‍රමවත් සුසාන චාරිත්‍ර විධි අනුගමනය කිරීම.
- ගල් මෙවලම් තාක්ෂණය වෙනුවට යකඩ ලෝහය භාවිත කිරීම යනාදී ශිෂ්ටාචාරයේ වර්ධනයට අදාළ මූලික දෑ ආරම්භ වීම සිදුවී ඇත්තේ,

1. ප්‍රාග් ඓතිහාසික යුගයේ දීය.
2. ඓතිහාසික යුගයේ දීය.
3. විජය කුමරු ඇතුළු පිරිස මෙරටට පැමිණි යුගයේ දීය.
4. පූර්ව ඓතිහාසික යුගයේ දීය.

(18) රුවන්වැලි සෑයට පූජාවක් කිරීම සඳහා අවශ්‍ය වීදුරු පබළු රැගෙන ඒමට රෝමයට තානාපති නිලධාරීන් යවන ලද්දේ,

1. නිශ්ශංකමල්ල රජු 2. කනිට්ඨතිස්ස රජු
3. භාතිකාභය රජු 4. වසභ රජු

(19) අතීතයේ දී අබල, වපර, පූගය, නියමස්ථාන, වාපර යන වචන සම්බන්ධ වූයේ පහත සඳහන් කුමන කටයුත්තක දීද?

1. රාජ්‍ය පාලනය 2. ගොවිතැන
3. වෙළඳාම 4. සත්ත්ව පාලනය

(20) සාහිත්‍ය මූලාශ්‍රවල 'පරික්කිත්ත ගම්' යනුවෙන් අදහස් කළේ කුමක් ද?

1. වැව් ඉස්මත්තේ පිහිටි ගම් 2. අත්හැර දැමූ ගම්
3. වැටකින් ආරක්ෂා කර තිබූ ගම් 4. වරාය ආශ්‍රිතව තිබූ ගම්

(21) සෙල්ලිපිවල වෛද්‍යවරුන් හැඳින්වීමට භාවිතා කළ පදය නම්,

1. ආචාර්ය 2. වොහාර 3. කුබකර 4. වෙජ

(22) වෙළඳපලට පැමිණෙන කරත්තවලින් මිස වෙළඳපල පසුකොට යන කරත්ත වලින් බදු අයකර ගැනීම නොකළ යුතු බවට නීතියක් සඳහන් වන වෙළඳපල කුමක් ද?

1. සීගිරිය 2. හෝපිටිගම 3. හසලක 4. අනුරාධපුරය

(23) ''අ'' තීරුවේ ඉතා පුරාණ කාලයේ දී ලංකාවේ පැවති විවිධ කර්මාන්තයන් ද 'ආ' තීරුවෙන් එම කර්මාන්යන් හි නියලුණු ශිල්පීන් ද සඳහන් වේ. 'අ' තීරුව හා 'ආ' තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| 'අ' තීරුව | | 'ආ' තීරුව |
|---|---|---|
| කබර | A | මැණික් කර්මාන්තයේ යෙදෙන්නන් ය. |
| මණිකර | B | රෙදි විවීම කරනු ලබන ශිල්පීන් ය. |
| තුලාධාර | C | යකඩ වැඩ කළ කම්මල්කරුවන් ය. |
| දටික | D | ඇත්දත් කැටයම් කළ ශිල්පීන් ය. |
| | E | රන් කරුවන් ය. |

1. C A D E 2. A B C E 3. C A E D 4. D A B C

(24) 'අහසින් වැටෙන එක දිය බිඳක්වත් ප්‍රයෝජනයට නොගෙන මුහුදට යාමට ඉඩ නොදිය යුතුය' යන ප්‍රකාශය කළ රජු වන්නේ,

1. I කාශ්‍යප රජු 2. මහා පරාක්‍රමබාහු රජු
2. දුටුගැමුණු රජු 4. නිශ්ශංකමල්ල රජු

(25) සීගිරියේ බටහිර ජල උද්‍යානයේ තිබෙන එක්තරා සෙල්ලිපියක 'අබල වපර' නමින් හඳුන්වා ඇත්තේ,

1. සියඹලා වෙළෙන්දෙකි 2. මැටි වළං වෙළෙන්දෙකි
3. සළුපිළි වෙළෙන්දෙකි 4. ලෝහ වෙළෙන්දෙකි

(26) 'දියකැට පහණ' යන්න පැහැදිලි වන වඩා නිවැරදි පිළිතුර කුමක් ද?

1. ගල්කණු කිහිපයක් සහිත සොරොව්වකි.
2. විශාල වැව්වල බිසෝ කොටුව තුළ ජල මට්ටම මැනීමට භාවිතා කළ ගල් කණුවකි.
3. සොරොව්වට සම්බන්ධ ගල් කණුව නිසා වියළි කාලයේ දී ගල් ඉවත් කර ජලය ලබාගත හැකි උපකරණයකි.
4. පැරණි වැව්වල ජලය පිටතට ගැනීම සඳහා සොරොව්වට සම්බන්ධ ගලින් කළ කණුවකි.

(27) අතීත සෙල්ලිපිවල 'වදාළ' යන පදයෙන් දක්වා ඇත්තේ,

1. ව්‍යවස්ථාදයකයා යි 2. අධිකරණය යි
3. රජතුමා යි 4. ආරක්ෂක නිළධාරීන්ය

(28) පළමුවන පරාක්‍රමබාහු රජු ඉපදුණු 'පුංඛගාම' නම් තැන වර්තමානයේ හඳුන්වන්නේ,

1. හෝපිටිගම 2. දෑදිගම 3. පොළොන්නරුව 4. අනුරාධපුරය

(29) සියල්ලටම වඩා රජු උත්තරීතරය. ඔහු රටවැසියාට ඊශ්වරයෙකු බව දැක්වෙන දඹුලු විහාරයේ සෙල්ලිපිය අයත් රජු වන්නේ,

1. කුටකණ්ණතිස්ස රජු
2. I වන විජයබාහු රජු
3. හතරවන මහින්ද රජු
4. නිශ්ශංකමල්ල රජු

(30) වැව්වල ජලය භාවිත කරන්නන්ගෙන් අය කළ බද්ද හඳුන්වන්නේ,

1. බොජකපති
2. මතරමජිබක
3. දකපති
4. මේකාප්පර්

(31) ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය කාර්මික විප්ලවය කෙරෙහි බලපාන්නේ කුමන ආකාරයට ද?

1. කෘෂිකර්මයට අවශ්‍ය ඉඩම් ලබාදීමෙනි.
2. නිෂ්පාදන කර්මාන්ත වලට ශ්‍රමය ලබාදීමෙනි.
3. කර්මාන්ත ශාලාවලට අවශ්‍ය ඉඩම් ලබාදීමෙනි.
4. ආකර කර්මාන්තය සඳහා ඉඩම් යොදා ගැනීමෙනි.

(32) රාජ්‍ය ලේකම්, මුදල් ලේකම් හා නීති ලේකම් යන රාජ්‍ය නිලධාරීන් තිදෙනා හමුවන්නේ,

1. සෝල්බරී ආණ්ඩුක්‍රමයෙනි
2. ඩොනමෝර් ආණ්ඩුක්‍රමයෙනි
3. මැනිං ආණ්ඩුක්‍රමයෙනි.
4. මැනිං ඩෙවෙන්ෂයර් ආණ්ඩුක්‍රමයෙනි

(33) 1953 දී වාමාංශික පක්ෂය විසින් මෙහෙය වූ හර්තාල් ව්‍යාපාරය නිසා අගමැති තනතුරෙන් ඉල්ලා අස්වූයේ,

1. ඩී.එස්. සේනානායක
2. එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක
3. විලියම් ගොපල්ලව
4. ඩඩ්ලි සේනානායක

(34) දොස්තර එස්.ඒ. වික්‍රමසිංහ මහතා ප්‍රධානත්වයෙන් පිහිට වූ පක්ෂය වන්නේ,

1. එක්සත් ජාතික පක්ෂය
2. ලංකා සමසමාජ පක්‍ෂය
3. ලංකා කොමියුනිට්ස් පක්ෂය
4. කම්කරු පක්‍ෂය

(35) ලංකාවේ දැනට තිබෙන කලාත්මක වටදාගෙය ලෙස සැලකෙන්නේ,

1. මැදිරිගිරියේ වටදාගෙය
2. ථූපාරාම වටදාගෙය
3. පොළොන්නරු වටදාගෙය
4. තිරියාය වටදාගෙය

(36) පෘතුගීසීන් ශාන්ත ලෝරන්ස් නගරය නමින් හැඳින්වූ නගරය වන්නේ,

1. කෝට්ටේ
2. ගාල්ල
3. නුවර
4. කොළඹ

(37) පෘතුගීසී පාලනයේ දී පූජකතුමා හැඳින්වූයේ,

1. විසුරේ
2. උදෝර්වරු
3. සිංඤෝරේ
4. විකාර් ජනරාල්

(38) පිළිමගෙය හා එය ඉදිකිරීමේ සම්ප්‍රදාය නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,

1. තොලුවිල - ලෙන් විහාර සම්ප්‍රදාය
2. තිවංක පිළිමගෙය - ගෙඩිගේ සම්ප්‍රදාය
3. පිදුරංගල - ගන්ධ කුටි සම්ප්‍රදාය
4. පංකුලිය - ලෙන් විහාර සම්ප්‍රදාය

(39) පෘතුගීස් කපිතාන් ජනරාල් දියෝගෝ ද මේලෝ යටතේ කන්ද උඩරට රාජ්‍යයට එල්ල කරන ලද අවසාන පෘතුගීසි ආක්‍රමනය වූයේ,

1. ගන්නෝරුව සටන
2. බලන සටන
3. දන්තුරේ සටන
4. රන්දෙනිවල සටන

(40) උඩරට රාජධානිය බ්‍රිතාන්‍යයන්ට යටත් වූ බව නිල වශයෙන් පිළිගත් ඓතිහාසික ලියවිල්ල වන්නේ,

1. 1638 - වෙස්ටර් වෝල්ඩ් ගිවිසුම
2. 1572 - මල්වානේ ගිවිසුම
3. 1815 - උඩරට ගිවිසුම
4. 1818 - නොවැම්බර් උඩරට ප්‍රකාශය

# ඉතිහාසය

**රට හදන ඉතිහාසය පන්තිය**

**අ පො ස සාමාන්‍ය පෙළ 2020 (2021 මාර්තු)**

| ශ්‍රේණිය 11 | විෂය - ඉතිහාසය | පත්‍රය II | කාලය - පැය 3 |
|---|---|---|---|

- **I වන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **II කොටසින් ප්‍රශ්න 4 ක්ද, III කොටසින් ප්‍රශ්න 1 තෝරා සම්පූර්ණ ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**
- **පහත I කොටසේ ස්ථාන ලංකා සිතියමක ද, II කොටසේ ස්ථාන ලෝක සිතියමකද ලකුණු කරන්න.**

## I කොටස

(01) (අ) i. අනුරාධපුර, ජජ්ජර නදී, උතිනගර, ගල් සොහොන් කනත්ත, උඩරචාමඩම, කාචර ගාම, ජම්බුකෝලපට්ටන, මාතොට, කලා වැව, ඇලහැර අමුණ, ගාල්හ නදී, පාහියන්ගල

ii. මලක්කා සමුද්‍ර සන්ධිය, බැග්ඩෑඩ්, කොන්ස්තන්තිනෝපලය, රතු මුහුද, ගෝව, මක්කම

(ආ) පහත ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න

I. ලංකාවට පැමිණි මුල්ම ලන්දේසි ජාතිකයා
II. යාපනයට පෘතුගීසින් පැමිණෙන විට යාපනයේ පාලකයා
III. ලංකාවට පැමිණි මුල්ම පෘතුගීසි ජාතිකයා
IV. ලංකාවේ සාහිත්‍යයේ ස්වර්ණමය අවධිය

(ඉ) රූප සටහන් හඳුනා ගනිමින් පිළිතුරු සපයන්න



(a)
i. මෙහි දැක්වෙන රූපය නම් කරන්න.
ii. මෙය කවුරුන් විසින් කරවන ලද්දක් ද?
iii. මෙය පිහිටා ඇති දිස්ත්‍රික්කය කුමක් ද?
iv. අභිලේඛන ලියා ඇති මාධ්‍යයන් 03 ක් ලියන්න.



(b)
i. මෙම රූපයෙන් දැක්වෙන පුද්ගලයා කවුද?
ii. මෙතුමා පිහිට වූ සමාගම කුමක් ද?
iii. මෙතුමා මෙරටට පැමිණෙන සමයේ පැවති ගැටලුව කුමක්ද?
iv. මෙතුමාගේ සිදුවූ සේවාවන් 3ක් ලියන්න.

## II කොටස

(02) i. එදා පැවති තාක්ෂණය පිළිබඳ විස්තරාත්මක දැනුමක් ලබාගත හැකි වූ ජ්‍යාමිතික ක්ෂුද්‍ර ශිලා මෙවලම් පිළිබඳ කරුණු 3ක් ලියන්න.

ii. ගල් යුගයේ වැසියන්ගේ ආහාර රටාව පිළිබඳ කරුණු 2 ක් දක්වන්න.

iii. පහත දැක්වෙන ගම් කුමන වෘත්තිකයන් විසූ ගම් දැයි ඉදිරියෙන් ලියන්න.

a. කසීකාරගාම

b. කේවට්ටගාම

c. කුම්භකාරගාම

d. ඔළගම්

e. වඩ්ඪකීගාම

iv. ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය ඊට පෙර පැවති ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන් වී කැපී පෙනීමට පදනම්වූ කරුණු තුනක් සඳහන් කර පැහැදිලි කරන්න.

(03) i. පහත සඳහන් වැව් නිර්මාණය කළ රජවරුන් කරන්න.

(1) බසවක්කුලම (2) මින්නේරිය (3) පරාක්‍රම සමුද්‍රය

ii. වැවක් කේන්ද්‍ර කරගෙන වර්ධනය වූ ජනාවාස 'වාපීගාම' ලෙස හඳුන්වයි. එසේ බිහි වූ වාපිගාම හතරක් නම් කරන්න.

iii. පැරණි සෙල්ලිපිවල සඳහන් වන ආකාරයට ගමේ ප්‍රධානියා වූ ගමිකගෙන් ඉටු වූ කාර්යයන් දෙකක් දක්වා පැහැදිලි කරන්න.

iv. පුරාණ ගම්වැසියේ 'එල්ලංගාවක්' හෙවත් වැව් පද්ධතියක් සෑදීමේ අරමුණු දෙකක් තිබුණි.

(04) i. අතීතයේ දී වෛද්‍ය විද්‍යාවේ දියුණුව සඳහා කටයුතු කළ රජවරුන් තුන්දෙනෙක් සඳහන් කරන්න.

ii. අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳව පැරැන්නන් තුළ පැවති අවබෝධය උදාහරණ දෙකක් සහිතව ලියා දක්වන්න.

iii. අපේ මුතුන් මිත්තන් ඉතා ඈත අවධියක සිට යකඩ නිස්සාරණය කිරීමේ තාක්ෂණය දැන සිටි බව පැහැදිලිය. ඒ සඳහා උදාහරණ දෙකක් සපයා පැරණි යකඩ නිස්සාරණ තාක්ෂණයේ ස්වරූපය පැහැදිලි කරන්න.

iv. ඉතා විශිෂ්ට වාරි තාක්ෂණයකට දකුණු ආසියාවෙන්ම උරුමකම් ඇත්තේ ශ්‍රී ලාංකිකයන් හටය. පැරණි වාරි තාක්ෂණයේ පැවති විද්‍යාත්මක දියුණුව උදාහරන තුනක් සහිතව විස්තර කරන්න.

(05) i. පොළොන්නරු රාජධානිය බිඳවැටීමට හේතු 03ක් ලියන්න.

ii. කුරුණෑගල රාජධානිය පාලනය කළ රජවරු 4ක් පිළිවෙලින් දක්වන්න.

iii. ක්‍රි.ව. 1415 සිට 1467 දක්වා කෝට්ටේ රාජධානිය පාලනය කළ රජු දක්වා එතුමා ගෙන් සිදු වූ සේවාවන් 4ක් ලියන්න.

iv. කෝට්ටේ රාජධානියේ සමයේ ඇති වූ අධ්‍යාපනික හා සාහිත්‍ය අංශයේ ප්‍රබෝධය පිළිබඳ කරුණු හා උදාහරණ දක්වමින් විස්තර කරන්න.

(06) i. ලංකාවේ ප්‍රධාන වැවිලි බෝග තුනක් නම් කරන්න.
ii. 1972 ව්‍යවස්ථාවේ මූලික ලක්‍ෂණ 4ක් ලියන්න.
iii. 1978 ව්‍යවස්ථාවේ ජනාධිපතිවරයා සතු බලතල 2ක් විස්තර කරන්න.
iv. නිදහසින් පසු මෙරට අධ්‍යාපන ක්‍ෂේත්‍රයේ ඇති වූ කැපී පෙනෙන ලක්‍ෂණ තුනක් සාකච්ඡා කරන්න.

(07) i. ලංකාවට පැමිණි බටහිර ජාතීන් 3ක් නම් කරන්න.
ii. ත්‍රිකුණාමල වරාය කෙරෙහි ඉංග්‍රීසීන්ගේ අවධානය යොමුවීමට බලපෑ හේතු දෙකක් දක්වන්න.
iii. ඉංග්‍රීසි පාලනයට විරුද්ධව ගෙන ගිය පළමු නිදහස් අරගලය වන 1818 සටන අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් දක්වා උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.
iv. ඉංග්‍රීසීන්ට කන්ද උඩරට යටත් කරගැනීමට අවශ්‍ය වූ හේතු 3ක් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

## III කොටස

(08) i. කාර්මික විප්ලවය ප්‍රධාන කර්මාන්ත තුනක් ඇසුරින් සිදුවිය. එම කර්මාන්ත තුන නම් කරන්න.
ii. a. කාර්මික විප්ලවනය හේතුවෙන් පේෂ කර්මාන්තයේ ඇති වූ නව සොයා ගැනීම් දෙකක් ලියන්න.
b. කාර්මික විප්ලවය හේතුවෙන් සන්නිවේදන ක්‍ෂේත්‍රයේ සිදුවූ නව සොයා ගැනීම් දෙකක් සඳහන් කරන්න.
iii. කාර්මික විප්ලවය හේතුකොට ගෙන කෘෂිකාර්මික ක්‍ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් 2ක් පැහැදිලි කරන්න.
iv. කාර්මික විප්ලවය ශ්‍රී ලංකාව කෙරෙහි බලපෑ ආකාරය කරුණු 2ක් ඇසුරින් විස්තර කරන්න.

(09) i. පළමුවන ලෝක සංග්‍රාමයට තුඩු දුන් හේතු 03 ක් ලියන්න.
ii. ලෝක සාමය ආරක්‍ෂා කිරීමේ අපේක්‍ෂාවෙන් ඇරඹි ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට හේතු 4ක් ලියන්න.
iii. ජර්මනියේ හිට්ලර්ගේ ක්‍රියා කලාපය පිළිබඳ කරුණු වශයෙන් දක්වමින් පැහැදිලි කිරීමක් කරන්න.
iv. දෙවන ලෝක සංග්‍රාමය නිසා ඇති වූ ප්‍රතිඵල 3ක් දක්වමින් විස්තර කරන්න.



